ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk


# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව** |
| දිනය | **2018 දෙසැම්බර් 05** |

## ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් ලිමිටඩ්හි තැන්පතුකරුවන් හට වන්දි මුදල් ලබා දීම

මුදල් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාම සඳහා ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් ලිමිටඩ් වෙත ලබා දී තිබූ බලපත්‍රය 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ විධිවිධාන ප්‍රකාරව, 2018.07.25 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන ලදී.

ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් ලිමිටඩ්හි තැන්පතුකරුවන් හට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ වන්දි මුදල් ගෙවීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පියවර ගෙන ඇත. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට අදාළව නිකුත් කර ඇති රෙගුලාසීන්ට අනුකූලව මෙම වන්දි මුදල් ලබා දීමට කටයුතු කරනු ඇති අතර වන්දි මුදල් සඳහා අයදුම් කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදී මුද්‍රිත සහ සමාජ මාධ්‍ය ඔස්සේ උපදෙස් ලබා දෙනු ඇත.

එකී දැනුම්දීම මාධ්‍යවල පළ වූ පසුව, අදාළ උපදෙස් ප්‍රකාරව නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් නියමිත ලිපි ලේඛන ද සමග ශ්‍රී ලංකා මහ බැංකුවේ නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆයිනෑන්ස් ලිමිටඩ්හි තැන්පතුකරුවන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

මේ සම්බන්ධ වැඩි දුර තොරතුරු පහත දැක්වෙන දුරකථන අංක වෙත ඇමතීමෙන් ලබා ගත හැකි ය.

0112-398788

0112-477261